# ඔයාව කවදාවත් අමතක වෙන්නෙ නෑහැ...



පියුමංසි උමායා මාපාබණ්ඩාර

# ඔයාව කවදාවත් අමතක වෙන්නෙ නැහැ...



*පියුමංසි උමායා මාපාබණ්ඩාර*

***ISBN 978-624-206-990-6***

*කෘතිය පළ කරන දිනය – **2023.11.15***

*කතෘගේ වෙනත් කෘතීන් – අපූරු යාළුවෝ*

*පැණි පුහුල් ගෙඩිය*

# පිදුම

දිවා රෑ වෙහෙසී මගේ අනාගතය
වෙනුවෙන් ඇප කැප වන මගේ
ආදරණීය අම්මාට, අප්පච්චීට, සහ මා
පුංචි කාලයේ සිට රැක බලාගත්
කිරිඅම්මාට, කිරිඅත්තාට සහ මෙම
පොත ලිවීමට උනන්දු කර වූ අපේ
ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ට
සහ අපට පළමු වසරේ සිට දෙවන
වසර දක්වා පංති භාරව සිටි අපගේ
ආදරණීය ගයනි ගුරු මෑණියන්ටත්,
ලහිරු ගුරු මෑණියන්ටත්, සමින්ද ගුරු
පියාණන්ට සහ මගේ පංතියේ සියලු ම
මිතුරියන්ට පිළිගන්වමි...

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

2023.11.01

# අපේ ගෙදරට ලේන් පැංචෙක්.....

ඔන්න පුංචි යාළුවනේ අපේ ගෙදර හදන කාලේ දවසක පුංචි ම පුංචි ලේන් පැටියෙක්ව අල්ලපු ගෙදර පූසා අල්ලන්න ගිහින් තියෙනවා. ඉතින් මේ පුංචි ලේන් පැටියා වත්ත පහළ හැංගිලා ඉඳලා. හැබැයි පූසාට නම් ලේන් පැටියාව අල්ලගන්න බැරි වෙලා. ඉතින් මේ ලේන් පැටියා හෙමින් හෙමින් එයාගේ කූඩුවට ගිහිල්ලා. ලේන් පැටියාගේ කූඩුව තිබුණේ, අපේ ගෙදර බිත්තියේ එල්ලලා තිබුණු ගේ කුරුල්ලන්ට ගෙනාපු මුට්ටියක. ඉතින් මේ පුංචි ලේන් පැටියා කූඩුවට යන්න ගිහින්. අනේ ඒත් මෙයා පුංචි. මෙයා ආපහු බිමට වැටිලා. ඔන්න ඔය වෙලාවේ තමයි අපේ ගෙදර හදන්න ඇවිත් හිටපු බාසුන්නැහේ මාමා කෙනෙක් මෙයාව දැකලා තියෙන්නේ. ඊට

පස්සේ අප්පච්චි කියලා, "මේ ලේන් පැටියාව බාසුන්නැහේ මාමාගෙ ගෙදර අරගෙන යන්න කියලා" ඔන්න ඔය අතරේ තමයි මම ඉස්කෝලෙ ඇරිලා ගෙදර ආවේ. ඉතිං අප්පච්චි මේ විස්තර ඔක්කොම මට කිව්වා. මට ආස හිතුණා මේ ලේන් පැටියාව අපේ ගෙදර තියාගන්න. අප්පච්චිත් ඒ අදහසට කැමති වුණා. ඊට පස්සේ අප්පච්චියි මමයි ගිහින් අර බාසුන්නැහේ මාමාගෙන් ලේන් පැටියා ඉල්ලා ගත්තා. ඒ බාසුන්නැහේ මාමා ලේන් පැටියා දුන්නාට පස්සේ මගේ ඉහේ මලක් පිපුණා වගේ මට දැනුණා. හරි... දැන් ලේන් පැටියාවත් තියාගන්නවා. ඒත් ඉතිං කොහෙද මේ ලේන් පැටියා දැන් තියාගන්නේ ? ඒක තමයි අපිට ආපු ලොකු ම ගැටළුව. ඔහොම ටික වෙලාවක් කල්පනා කරද්දි තමයි මතක් වුණේ අපේ ගෙදර තියෙන ප්ලාස්ටික් කූඩය ගැන.



ඉතින් අපි ඒ කූඩෙට සිනිඳු රෙද්දක් දාලා පුංචි ලේන් පැටියාව උණුසුම් රෙද්දකින් ඔතලා කූඩයෙන් තිබ්බා. අපේ ඊළඟ ගැටළුව වුණේ පුංචි ලේන් පැටියාට කන්න මොනවද දෙන්නෙ කියන එක. අපේ ගෙදර කිරි පිටි තිබුණා. ඒ නිසා අපි එයාට කිරි ටිකක් හැදුවා. කිරි හැදුවත් කොහොමද දැන් එයාට ඒක පොවන්නේ. ඔහොම ටික වෙලාවක් කල්පනා කර කර ඉන්නකොට අපිට මතක් වුණා පහන් තිරයකින් කිරි පොවන්න පුළුවන් කියලා. ඊට පස්සේ අපි පුංචි පීරිසියකට කිරි ටික දාලා ඒ කිරි ටික පහන්තිරේ පොඟවලා මේ පුංචි ලේන් පැටියාට පෙව්වා. දැන් ලේන් පැටියාට

කැමත් දීලා ඉවරයි. ඒත් ඉතිං එයාට නමකුත් එපැයි. නැත්තං අපි කොහොමද මෙයාට කතා කරන්නේ. ඔන්න ඉතින් අප්පච්චියි, මමයි ලේන් පැටියාට නමක් කල්පනා කරා. ඔහොම ටික වෙලාවක් කල්පනා කර කර ඉන්නකොට අපි හිතුවා එයාට මිකී කියලා නම තියන්න. හරි, දැන් ඔන්න එහෙනම් ලේන් පැටියාට නමකුත් හරි. මට හරි සතුටුයි. ඔහොම ටිකෙන් ටික දවස ගෙවුණා. අම්මාත් හවස ගෙදර ආවා. අම්මාත් මිකීට ගොඩක් කැමති වුණා. අපි මිකීට රැටත් කිරි දුන්නා.

ඔහොම ටික කාලයක් ගෙවුණා.

## මිකීගේ පුදුම වැඩ සහ මිකීට තව නමක්.....




ඔයාලා දන්නවා ද මිකී දැන් ටිකක් ලොකු වෙලා. මිකී අම්මා පොල් ගාන වෙලාවට කොහේ හරි ඉඳන් ඇවිත් අම්මාගේ උරහිසේ. එතැන ඉඳන් එයා මොකද දන්නවාද කරන්නේ...... පොල්

කනවා. ආ මට කියන්න අමතක වුණානේ එයාට දැන් ගස් උඩ යන්නත් පුළුවන්. තව එයා අපි තේ බොන වෙලාවට ඇවිත් එයාත් තේ බොනවා. තව අපි බත් කන වෙලාවට ඇවිත් එයත් බත් කනවා. හැබැයි එයා කන්නේ එයාගෙම බත් එකක් නම් නෙවෙයි. අප්පච්චිගේ බත් එක. බත් එකේ පැත්තකින් කෑවා නම් තව කමක් නැහැ. එයා කන්නේ අප්පච්චිගේ දකුණු අතේ තියන බත් ඇට. අප්පච්චිට ගොඩක් වෙලා යනකල් කන්න නැහැ.

ඔහොම ඉන්නකොට මිකීට තිබ්බ ආදරේ තවත් වැඩි වුණා. ඒ හින්දා එයාට “චූටි” කියන්න පටන් ගත්තා. ඉතිං දැන් එයාගෙ අලුත් නම චූටි. මිකී නෙවෙයි.

## යෝගට් මාරයා......

චූටි කෑවෙ බත්, පලතුරු වගේ දේවල් නේ. ඉතිං එක දවසක් අපි හිතුවා එයාට යෝගට් දෙන්න. අපි දවල්ට බත් කාලා ඉවර වෙලා යෝගට් කෑවා. චූටිටත් යෝගට් දුන්නා. චූටි යෝගට් එක කෑවෙ එක හුස්මට. එයාට ඒක රාජ භෝජනයක් වගේ වෙලා. එදායින් පස්සෙ අපේ ගෙදර යෝගට් නැති වුණේ නැහැ. ඒක මටත් වාසියක් වුණා. මටත් හැමදා ම යෝගට් කන්න ලැබුණා. චූටි, උදේට , දවල්ට, රෑට යෝගට් තමයි කෑවේ.



## චූටි නෑව්ව දාට……

අපි චූටිව නාවලත් තියනවා. එයාව නාවනකොට එයා සීතලේ ගැහෙනවා. එතකොට මට දුකයි. ආ... ඒ විතරක් නෙවෙයි. එයා නෑව්වෙ මගේ බේබි ෂැම්පු දාලා. එයාව නෑව්වේ අප්පච්චි. නාවලා ඉවර වුණාට පස්සේ එයාව හොඳට පිස දාන්නත් අමතක කලේ නැහැ. එයා හොඳට ම වේළුනාට පස්සේ අපි චූටිට යෝගට් එකක් දුන්නා. එයා ඒක ඔක්කොම කෑවා. නාවලා පැයක් යන්නෙ නැහැ ගස් උඩ දුවලා



පැනලා ආවම නැව්වට ඇත්තටම වැඩක් නැහැ.

## අනේ චූටි තරහා වෙලා......



එක දවසක් උදේ අපි ස්ලැබ් එක උඩ ඉන්නකොට අපිට පුංචි යාළුවෙක් හම්බ වුණා. ඒ යාළුවා තමයි තවත් ලේන් පැංචෙක්. හැබැයි මේ ලේන් පොඩ්ඩා අපේ චූටිටත් වඩා ගොඩක් පොඩියි. ඒ වෙලාවේ චූටි හිටියේ කූඩෙට වෙලා. අපි එයාගෙ කූඩෙත් එක්ක ම උඩට ගෙනාවා. ඒ මොකටද දන්නවා ද? චූටිට මේ අලුත් යාළුවා හඳුන්වා දෙන්න. ඒ හින්දා අපි අර

පුංචි ලේන් පැංචාවත් චූටිගේ කූඩෙට දැම්මා. එතකොට චූටි අර පැටියාව හපනවා. චූටි, ලේන් පැටියාට කැමති නැහැ වාගෙ. ඒත් ඉතින් මොනවා කරන්න ද? අපි අර ලේන් පැටියාව අතට ගත්තා.



අපි ලේන් පැටියා පහළට අරන් ඇවිත් එයාට යෝගට් එකක් දුන්නා. ඔහොම ටිකෙන් ටික හවස් වුණා. වෙනදාට නම් චූටි, හවස් වෙනකොට ගෙදර එනවා. ඒත් එදා හවස චූටි ගෙදර ආවෙ නැහැ. ඒ නිසා අපි අවට විපරමින් හිටියා. මෙන්න චූටි කූඩුවක් හදනවා.... අපි එයාව පහළට ගන්න හැදුවා. ඒත් බැරිවුණා. කොහොම

හරි අම්මා එයාව පහළට ගත්තා. ඊළඟ දවසේ මම උදේ ඇහැරෙන්නත් කලින් ම අර චූටි ලේන් පැටියාව යවලා. එයාගේ අම්මා ඒ පුංචි ලේන් පැටියාව කටින් අරන් තමයි ගිහින් තියෙන්නේ.



ඔහොම ටික දවසක් ගත වුණා. අපේ චූටි ආයෙ නොඑන්නම යන්න ගියා. ඒ ගියේ එයාගෙම අම්මයි, අප්පච්චියි ළඟට වෙන්න ඇති. ඒ නිසා මට දුකක් නැහැ. මට ගොඩක් සතුටුයි. එයා දැන් ලොකුයිනේ. චූටි සතුටින් ජීවත් වේවි. එයාටත් මට වගේම අම්මයි, අප්පච්චියි, සහෝදර සහෝදරියන් එක්ක

ගොඩක් සතුටින් ජීවත් වෙන්න පුළුවන් වෙන්න ඇති......



## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන කාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු....

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01